රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
பொது கடன் மேலாண்மை அலுவலகம்
Public Debt Management Office

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය (3 වැනි මහල), කොළඹ 001000, ශ්‍රී ලංකාව

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி)இ கொழும்பு 00100இ இலங்கை

Ministry of Finance, Planning and Economic Development
The Secretariat (3rd Floor), Colombo 00100, Sri Lanka

| නිකුත් කළේ | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය |
|---|---|
| දිනය | **2026 සැප්තැම්බර් 14** |

# මාධ්‍ය නිවේදනය

## 2026 සැප්තැම්බර් 11 වැනි දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව

2026 සැප්තැම්බර් 11 දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේදී සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර (සු.හ.ජා.) අංක වන LKB00934J156 සහ LKB01237G019 දරන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළුව ඔස්සේ ලද රුපියල් මිලියන 15,402ක මුළු ලංසු ප්‍රමාණය අතුරින්, පිළිගත හැකි උපරිම වටිනාකම වන රුපියල් මිලියන 8,000ක් (පිළිවෙලින් , රුපියල් මිලියන 5,000ක් සහ රුපියල් මිලියන 3,000ක් බැගින්), එම වෙන්දේසියේදී අදාළ සුරැකුම්පත් කාණ්ඩය සඳහා තීරණය කරන ලද බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය වන 11.96% සහ 12.08% යටතේ පිළිගන්නා ලදී.

ඒ අනුව, මෙම නිකුතුව සඳහා පිළිගනු ලබන සමස්ත වටිනාකම රුපියල් මිලියන 158,000 ක් වේ.

ඉහත නිකුතුව සඳහා ගෙවීම් කළ යුතු දිනය 2026 සැප්තැම්බර් මස 15 වේ.